# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2298/84 - 2022 සැප්තැම්බර් මස 24 වැනි සෙනසුරාදා - 2022.09.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 40 හා 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රොෂාන් රණසිංහ (පා.ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 22 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1986.01.20 දිනැතිව අංක 385/7 A දරන ගැසට් නිවේදනය මඟින් හා 2020.09.23 දිනැතිව අංක 2194/54 දරන ගැසට් නිවේදනය මඟින් සංශෝධිත 1974 සැප්තැම්බර් 20 වන දින අංක 130 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1974 අංක 3 දරන ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩාවලට සහභාගීවන්නන් පාලනය කිරීමේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් නැවත සංශෝධනය කරනු ලැබේ.

6අ. (අ) පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා, ආසියානු ක්‍රීඩා සහ සමාන ස්වභාවයේ වූ වෙනත් ජාත්‍යන්තර තරගවලදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට සහභාගීවන්නන් තෝරා ගැනීම ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින්මතු ''ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව'' යනුවෙන් මෙම නියෝගවල සඳහන් කරනු ලබන) ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවක් විසින් ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියට යටත්ව කරනු ලැබිය යුතුය.

(ආ) ජාතික ක්‍රීඩා තේරීම් කමිටුව -

(i) ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයාගේ මතයට අනුව ක්‍රීඩාවලට සුවිශේෂ සේවයක් ඉටුකර ඇත්තාවූ නැතහොත් ක්‍රීඩාවලදී විශිෂ්ට තත්ත්වයක් ලබා සිටින්නා වූ ද, ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, සාමාජිකයන් පස් දෙනෙක්

(ii) ජාතික ක්‍රීඩා සභාවේ නියෝජිතයෙක්, සහ

(iii) ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශයේ නියෝජිතයෙකුගෙන් සමන්විත විය යුතුය.

(ඇ) ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින්, ජාතික ක්‍රීඩා තේරීම් කමිටුවේ සභාපතිවරයා සහ ලේකම්වරයා පත් කරනු ලැබිය යුතුය.


1A - G 37616 — 08 (2022/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.